## කළුතර නගර සභාව

## කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 23 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් සඳහා වරිපනම්ලාභීන් වෙත ලබාදි තිබූ රු.990,962 ක් වූ වට්ටම වියදමක් වශයෙන් ගිණුම්වල දැක්විය යුතු වුවද එසේ නොකර වරිපනම් ආදායමෙන් අඩු කර දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායම සහ වියදම් රු.990,962 බැගින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.20,746 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන නොසැලසීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයහිමි වටිනාකම රු.20,746 ක් අඩුවෙන් හා වර්ෂයේ වියදම රු.20,746 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර හා 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති වටිනාකම රු.465,398 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) කළුතර දකුණ ගොවිජන සේවා මාවත බෝක්කුව හා වැසි ජල කාණුව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාලව ගෙවිය යුතු මුදල රු.553,954 ක් වුවත්, ණයහිමියන් ලෙස රු.650,996 ක් දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමි වටිනාකම රු.97,042 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ගබඩාවේ ඇති සත්‍ය තොග වටිනාකම රු.5,185,802 ක් වුවද මුල්‍ය ප්‍රකාශනවල රු.16,120,486 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට පොදු ගබඩා තොගය රු.10,934,684 කින් වැඩියෙන් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.28,650,545 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 40,755,710 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,105,165 ක පසුබෑමක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 27,937 | 18,469 | 19,355 |
| (ii) බදු කුලී | 7,433 | 6,943 | 1,077 |
| (iii) බලපත්‍ර ගාස්තු | 638 | 638 | -- |

2.2.2 **<u>වරිපනම් බදු</u>**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.24,274,938 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.14,078,921 ක් හෙවත් සියයට 58 ක් අයකරගෙන තිබුණි. පසුගිය වර්ෂයට අදාල හිඟ මුදලින් තවදුරටත් අයවිය යුතු ශේෂය රු.10,196,017 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල් කිරීම් රු.22,434,353 ක් වූ අතර ඉන් වර්ෂය තුළදී රු.14,016,172 ක් හෙවත් සියයට 62 ක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන බිල් කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.8,418,181 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ වරිපනම් හිඟ ශේෂය රු.18,614,199 ක් වූ අතර සමස්ථ අයකිරීමේ ප්‍රගතිය සියයට 60 ක් පමණක් විය. ඒ අනුව වරිපනම් ආදායම එකතු කිරීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවතුණි.

2.2.3 **<u>වෙළඳ ස්ථාන කුලී</u>**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.1,892,210 ක හිඟයක් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් අයකරගෙන තිබුණේ රු.1,293,058 ක් හෙවත් සියයට 68 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ ස්ථාන කුලී බිල් කිරීම රු.6,596,511 ක් වූ අතර වර්ෂය තුළ ඉන් රු.6,191,998 ක් හෙවත් සියයට 94 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.4 **<u>කඩකුලී</u>**

(i) සභාව සතු කඩකාමර 02 කින් රු.42,000 ක හිඟ කඩකුලියක් අය විය යුතු වුවත් අයකරගෙන නොතිබුණි.

(ii) සභාව සතු කඩකාමර 56 ක් අතුරු බදු දී ඇති බව සභාව විසින් 2012 වර්ෂයේදී කරන ලද සමීක්ෂණයකින් අනාවරණය කරගෙන තිබුණි.

- කඩකාමර 10 ක බදු අයිතිය ලබාදීමට අනුමැතිය ලැබී ඇතත් ඉතිරි කඩකාමර නිරවුල් කරගැනීමට 2016 නොවැම්බර් 30 දින තෙක් කටයුතු කර නොතිබුණි.
- නැවත වෙනත් පුද්ගලයින්ට පවරා දිය යුතු කඩකාමර තෝරා ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබුණි.

- සභාව සතු කඩකාමර 2 ක ගිවිසුම් අළුත් කිරීමක් හෝ කුලී සංශෝධනයක් සිදු නොකර පවත්වාගෙන යන බව නිරික්ෂණය විය.

## 3. **මෙහෙයුම් සමාලෝචනය**

### 3.1 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම හා වරිපනම් බදු අය නොකිරීම

-----------------------------------------------------------------------------

(i) 2012 වර්ෂයේ සිට 2016 සැප්තැම්බර් 30 දක්වා ලැබී තිබූ ගොඩනැගිලි අයදුම්පත් 731 කින් ගොඩනැගිලි සැලසුම් 609 ක් පමණක් අනුමත කර තිබූ අතර එම අනුමත කළ සැලසුම්වලින් 86 ක් සඳහා අනුකූලතා සහතික ලබාදී තිබුණි. එම ගොඩනැගිලි 86 න් 63 ක් සඳහා වරිපනම් තක්සේරු ලබාගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ නමුත් ඉතිරි 23 සඳහා වරිපනම් තක්සේරුවක් සිදු කර ආදායම් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අනුකූලතා සහතික ලබාගැනීම සඳහා ඉදිරිපත් නොකළ ඉතිරි ගොඩනැගිලි 523 සම්බන්ධයෙන් භෞතික පරීක්ෂාවක් සිදු කර ඒවා ඉදි කර ඇතිද යන්න තහවුරු කිරීමක් සිදු කර නොතිබුණි.

(iii) 2016 මාර්තු 17 දින ව්‍යාපාරික කටයුතු ආරම්භ කරතිබූ මහල් 07 කින් සමන්විත වර්ග අඩි 70674 ක් වූ කළුතර නගර මධ්‍යයේ පිහිටි ගොඩනැගිල්ලක්, පෞද්ගලික සමාගමක් සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කර නොමැති වුවද ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සභාව විසින් ඉඩදී තිබූ බැවින් නගර සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) **අනවසර ඉදිකිරීම්**

(i) අනවසර ඉදිකිරීම්වලට අදාල ලිපිගොනු නියැදි පරීක්ෂාවේදී අනවසර ඉදිකිරීම් කරනු ලැබූ පුද්ගලයින්ගේ අනවසර ඉදිකිරීම් අත්හිටුවන ලෙසත්, අනවසර ඉදිකිරිම නීත්‍යානුකූල කරගන්නා ලෙසත් ලිපියක් මගින් දන්වා යැවීම පමණක් සිදු කර තිබුණි. ඒ අනුව නිරීක්ෂිත ලිපිගොනුවලට අදාලව එම ඉදිකිරීම් නීත්‍යානුකූල කරගැනීමට අවශ්‍ය කටයුතු කර තිබූ බවක් නිරීක්ෂණය නොවූ අතර ඒ පිළිබඳ පසු විපරම් කිරීමක්ද කර නොතිබුණි.

(ii) 2016 ඔක්තෝබර් 12 දින කාර්මික නිලධාරී සමග අනවසර ඉදිකිරීම් 09 ක් භෞතිකව පරීක්ෂා කළ අතර නගර සභාවේ ඉදිකිරීම් අත්හිටුවීමේ නියෝග නොතකා එම ඉදිකිරීම් තවදුරටත් සිදු කරගෙන ගොස් තිබුණි. නගර සභාවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව සන්නිවේදන කුළුණු 09 ක්ද සහා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබුණි.

(iii) ඉහත අනවසර ඉදිකිරීම් අතුරින් හීනටියන්ගල පාරේ මරික්කාර් වීදිය අසල වගුරු බිමකින් පර්චස් 30 ක් පමණ ගොඩ කර, කළුතර දකුණ, ගාලු පාරේ අංක 132 හි පිහිටි හාඩ්වෙයාර් ආයතනයකට අයත් ගබඩාවක් ඉදි කර තිබූ අතර එම අනවසර ඉදිකිරීම පිළිබඳ නගර සභාව දැනුවත් වී නොතිබුණි.

(ඈ) <u>ත්‍රිරෝද රථ ගාස්තු අයකිරීම</u>

සභා අනුමැතිය මත 2012 වර්ෂයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි ත්‍රිරෝද රථ නැවතුම් ගාස්තු අයකිරීම සිදු කර තිබූ අතර 2012 වර්ෂයෙන් පසු ත්‍රිරෝද රථ බලපත්‍ර ගාස්තු ආදායම අයකරගැනීම සඳහා අදාල නැවතුම්පලවල අනුමත ත්‍රිරෝද රථ සංඛ්‍යාවන් පිළිබඳව ගැසට් ප්‍රකාශනයක් නිකුත් කිරීම සිදු කර නොතිබුණි.

(ඈ) <u>ඉඩම් බදුදීම</u>

කළුතර දකුණ ගඟබඩ පාරේ අංක 25/1 හි පිහිටි නගර සභාවට අයත් පර්චස් 06 ක බිම් කොටසක් සභාපතිවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව 2004 මැයි 06 දින අවුරුදු 30 ක බදු පදනම මත නගර සභා සේවකයෙකුට පදිංචිය සඳහා ලබා දී තිබුණි. කළුතර නගරයට ඉතාම ආසන්නයේ පිහිටි මෙම භූමි ප්‍රමාණය සඳහා වර්ෂයකට රු.600 ක මුදලක් 2004 මැයි 06 සිට 2034 මැයි 06 දක්වා අය කිරීමට ගිවිසුමකට එළඹ තිබූ අතර, එකී මුදල තීරණය කිරීමේදී රජයේ තක්සේරුකරුවෙකුගෙන් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.

(ඉ) <u>නගර සභා පුස්තකාල භූමියේ වෙළඳ කුටිය නැවත ඉදිකිරීම</u>

(i) වැඩ අධිකාරී විසින් සකස් කරන ලද සැලැස්මට අනුව කුලී හිමියා විසින් වෙළඳ කුටිය නැවත ඉදිකර තිබුණි. දෙපාර්ශවය විසින් ඇති කර ගත් ගිවිසුමෙහි 14 ඡේදය අනුව බදු ගැණුම්කරු විසින් එකී කඩකාමරයෙන් පිටත ආලින්දයේ හෝ වෙනත් කිසිම ස්ථානයක වෙළඳ බඩු හෝ වෙනත් භාණ්ඩ තැබීම, ගබඩා කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු වුවත් කඩ කාමරයේ පිටත ආලින්දයේ

වෙළඳ භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබුණු අතර සැලැස්මට පිටතින් වහලයක්ද ගසා තිබුණි.

(ii) මෙම කඩ කාමරය සඳහා 2013 පෙබරවාරි මාසයේදී, මාසිකව රු.6,250 බැගින් වර්ෂ දෙකක කාලයක් සඳහා වලංගු වන පරිදි කුලී තක්සේරුවක් කර තිබුණු අතර 2015 පෙබරවාරි මාසයෙන් පසුව නැවත කඩ කුලී තක්සේරුව සිදු කළ යුතු වුවත්, 2016 දෙසැම්බර් දක්වා සිදු කර නොතිබුණි.

(iii) 2016 මැයි 20 වන දින නැවත ගිවිසුම අළුත් කර තිබූ අතර එම ගිවිසුම අළුත් කිරීමේදී නව තක්සේරුවක් සිදු නොකර 2013 වර්ෂයේ තක්සේරුව පදනම් කර ගෙන මාසික කුලිය තීරණය කර තිබීම හේතුවෙන් සභාවට ලැබීමට නියමිත ආදායම අහිමි වීමක් සිදු වී තිබුණි.

(ඊ) **<u>භාණ්ඩ සමීක්ෂණය</u>**

(i) වසර කිහිපයක සිට පාවිච්චියට ගෙන නොතිබූ හා ලියාපදිංචි කර නොතිබූ සොලැක්ස් ජල බවුසරය, නිශාන් ගිනි රථය හා ගලි බවුසරයක් වාහන අංගනය තුළ තිබුණි.

(iii) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පරීක්ෂාවේදී මතු වූ ගැටළු නිරාකරණය කිරීමට යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කර ඇතත් මියගිය හා ස්ථාන මාරුවී සිටි නිලධාරීන් භාරයේ තිබූ භාණ්ඩ කිහිපයක් සභාවට ලබාගැනීමට හෝ එම වටිනාකම අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) **<u>වාහන පාලනය</u>**

වාහන 03 ක මයිලෝමීටර අක්‍රිය තත්වයේ පවතින නමුත් ඒවා අළුත්වැඩියා කිරිමට කටයුතු කර නොතිබුණි.

3.2 **<u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

2015 ජනවාරි 01 සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලංකා බැංකු ජංගම ගිණුමක රු.4,541,754 ක මුදලක් රඳවාගෙන තිබුණි.

3.3 **<u>කොන්ත්‍රාත් පාලනය</u>**

(අ) කළුතර දකුණ වෙට්ටුමකඩ වෙළඳ සංකීර්ණය ඉදිරිපිට දැල්වැට ඉදිකිරීම හා වැඩ පරිපාලක කාමරය ඉදිකිරීම (පකිස්ථාන් ක්‍රීඩාපිටිය ඉදිරිපිට)

-----------------------------------------------------------------------------------------------

(i) රු.1,008,148 ක ඇස්තමේන්තුවක් මත අනුමත සමිති 04 කින් සීමිත මිල කැඳවූ බව දක්වා තිබුණත් මිල කැඳවීම්වලට අදාලව සනාථ කරගැනීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) ගිවිසුමට අනුව කර්මාන්තය 2016 අප්‍රේල් 05 දින අවසන් කළ යුතු වුවත් දැල්වැට ගැසීමේ කාර්යය පමණක් සිදු කර තිබුණි.

(iii) ඇස්තමේන්තුවේ අයිතම් 37 ට අනුව දැල් වැට ගැසීමට අදාල GI පයිප්ප උස අඩි 10 ක් විය යුතු වුවත් අඩි 08 කට නිමා කර තිබුණු අතර උසස් තත්ත්වයේ GI පයිප්ප සඳහා ඇස්තමේන්තු නොකර මධ්‍ය තත්ත්වයෙන් යුතු පයිප්ප සඳහා ඇස්තමේන්තු සකස් කිරීම තුළ, පැවැත්ම පිළිබඳව නොසලකා තිබුණි.

(iv) ගිවිසුම් ප්‍රකාරව පරිපාලක කාමරය ඉදිකිරීමේ කාර්යය සිදු කර නොතිබුණි.

(ආ) **<u>නිම නොකළ කර්මාන්ත</u>**

ඇස්තමේන්තුගත රු.17,869,508 ක් වූ කර්මාන්ත 21 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) **කර්මාන්ත වැඩ නිමි වාර්තා සකස් නොකිරීම**

(i) 2016 වර්ෂයේදී සභාව විසින් ඉටු කර තිබූ රු.3,754,579 කට ඇස්තමේන්තු කර තිබූ කර්මාන්ත 11 ක් සඳහා වැඩ නිමි වාර්තා සකස් කර නොතිබීම හේතුවෙන් සහා කර්මාන්ත සඳහා වර්ෂය තුළ කළ වියදම කොතෙක්ද යන්න ගණනය කිරීමට නොහැකි විය.

(ii) කළුතර දකුණ බස් නැවතුම් පොළෙහි පළුදු වූ අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය කිරිම සඳහා රු.27,867 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර මෙම කර්මාන්තය 2016 ජූනි මාසයේ ඉටු කර තිබූ නමුත් වැඩ නිමි වාර්තා පිළියෙල කර නොතිබුණි. දෙවන වර තාර දැමීම සඳහා තාර ලීටර් 63 ක් ඇස්තමේන්තු කර තිබුණත් දෙවන වර තාර දැමීම සිදු කර නොතිබුණි.

3.4 **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

මේ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කළුතර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි නගර සභාව විසින් කසළ බැහැර කරනු ලබන අක්කර 06 රූඩ් 02 පර්චස් 05 වූ ඉඩමේ අක්කර 4 ක ප්‍රදේශයක පිහිටි පොහොරවත්ත කසල කළමනාකරණ ව්‍යාපෘතිය හා එහි අලෙවි කටයුතු 2009 දෙසැම්බර් 23 දින බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත ලබාදී තිබුණි. මේ සඳහා 2009 දෙසැම්බර් 23 සිට 2019 දෙසැම්බර් 22 දක්වා දස වසරකට වලංගු වන පරිදි බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමග ගිවිසුමක් ඇති කරගෙන තිබුණි.

(ආ) කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නගර සභාව විසින් කසළ බැහැර කරන භූමියට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ඇ) කසළ බැහැර කිරීම වෙනුවෙන් කසළ බදු පනවා නොතිබුණි.

(ඈ) සභාව සතු කසළ භූමියේ අනවසර පවුලක් පදිංචි වී තිබුණි.

(ඉ) අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව දීර්ඝකාලීන විශේෂ පුහුණුවක් සඳහා නිලධාරීන් යොමු කර නොතිබුණි.

(ඊ) අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු හා දත්ත පද්ධතියක් සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 3.5 කාර්යසාධනය

(අ) සභාවේ ජංගම ගිණුමේ මාසික සාමාන්‍ය ශේෂය රු. මිලියන 27 ඉක්මවා තිබූ අතර ඊට අමතරව රු. මිලියන 43 ක ස්ථාවර තැන්පතු පැවතුණි. මේ අනුව සභාවේ මූල්‍ය තත්වය යහපත් මට්ටමක පැවති නමුත් සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කර ඇති ප්‍රාග්ධන ව්‍යාපෘති ගණන 33 ක් වූ අතර එහි පිරිවැය රු. 8,039,710 ක් විය. සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක සභාවේ බලතල කාර්යය කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ බලධාරියා ලෙස ලේකම් විසින් මහජන ඉල්ලීම්, යෝජනා, අදහස් ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති හඳුනාගැනීමක් කළ යුතු වුවත් එවැන්නක් සමාලෝචිත වර්ෂයේදී නොවීම නිසා මහජනයාගේ සුභසාධනය අරමුණු කරගත් සභාවක් ලෙස වගකීම නිසි ලෙස ඉටු නොකර සභාව සතු මුදල් නිකරුණේ බැංකුවේ තැන්පත් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2016 අවසන් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2016 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය අනුව 2016 වර්ෂයේදී සභා කර්මාන්ත 29 ක් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු අතර බාහිර ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 07 ක් තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අනුව අයවැය ලේඛනය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 29 න් ව්‍යාපෘති 02 ක් පමණක් ඉටු කර තිබුණු අතර ව්‍යාපෘති නාමයන් පසුව වෙනස් කර එක් එක් අවස්ථාවන්වලදී සැලසුමකින් තොරව ව්‍යාපෘතීන් නම් කර තිබුණි.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ව්‍යාපෘති පරිපාලනය

(ඈ) අයවැය පාලනය